FP/06/100/05/01(iii) 2009.07.03

**රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛ අංක 01/2002 (X)**

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
රේගු අධ්‍යක්ෂ ජනරාල් / නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අධ්‍යක්ෂ ජනරාල්
සුරාබදු කොමසාරිස් ජනරාල්
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්
අනෙකුත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් වෙත

**රාජ්‍ය ආදායම ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ**

ඉහත මැයෙන් වූ 2002.07.17 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛ අංක 01/2002 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. රජය විසින් නව ආදායම් මූලායන් හඳුන්වා දී තිබීම හා දැනට ක්‍රියාත්මක ආදායම් සංකේතාංක ක්‍රමය ක්‍රමවත් කිරීමේ අරමුණින් 2002.07.17 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික චක්‍රලේක අංක 01/2002 හි උප ලේඛනය - 1 වෙනුවට නව ආදායම් සංකේතාංක පද්ධතියක් හඳුන්වා දීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව තිරණය කර ඇත. ඒ අනුව නව උප ලේඛනය -1 ඇතුළත් චක්‍රලේඛය මේ සමඟ නිකුත් කෙරේ.

03. 2002.07.17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ උප ලේඛනය - 11 හි ආදායම් ඇස්තමේන්තු යටතේ සඳහන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පමණක් අදාලවූ අංක 4 (ආ), 4 (ඇ) සහ 4(ඉ) යන ආකෘති පත්‍ර ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට 4 (ආ), 4 (ඇ)1, 4 (ඇ)11, 4(ඉ)1, 4(ඉ)11 සහ 4(ඉ)111 වශයෙන් නව ආකෘති පත්‍ර හඳුන්වා දී ඇත.

04. 2010.01.01 දින සිට මෙම නව ආදායම් සංකේතාංක ක්‍රමය බලපැවැත්වෙන අතර එදින සිට වන සියළුම ආදායම් ගණන්දීම් මෙම උප ලේඛනය -1 හි සඳහන් පරිදි කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ. 2002.07.17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ උප ලේඛනය -1ට අදාලව මේ දක්වා නිකුත් කරනු ලැබූ සියළු චක්‍රලේඛයන් 2010.01.01 දින සිට අවලංගු කෙරේ.

**ආර්. එච්. එස්. සමරතුංග**
**භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්**

පිටපත්: 1. විගණකාධිපති
2. සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
3. සියළුම පළාත් සභාවන්හි ප්‍රධාන ලේකම්වරුන්

## උපලේඛනය 1- ආදායම් වර්ගීකරණය

**බදු ආදායම**

| ආදායම් සංකේතය | විස්තරය | ව්‍යවස්ථාව/අධිකාර බලය | ආදායම් ගණන් දීමේ නිලධාරී |
|---|---|---|---|
| **10.01** | **ජාත්‍යන්තර වෙළදාම හා ගණුදෙනු සඳහා වූ බදු** | | |
| 10.01.01.00 | ආනයන බදු | - 1869 අංක 17 දරන රේගු ආඥා පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.02.00 | අපනයන බදු | - 1869 අංක 17 දරන රේගු ආඥා පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.03.00 | ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු | - 1969 අංක 1 දරන ආනයන අපනයන පාලන පනත | ආනයන හා අපනයන පාලක |
| 10.01.04.00 | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද | - 2002 අංක 11 දරන මුදල් පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.05.00 | සෙස් බදු | | |
| 10.01.05.01 | ආනයන සෙස් බදු | - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.05.02 | අපනයන සෙස් බදු | - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත,<br>1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත,<br>1971 අංක 46 දරණ පොල් සංවර්ධන අධිකාර පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.06.00 | මෝටර් වාහන අනුග්‍රාහක බද්ද | - 2006 අංක 11දරන මුදල් පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.07.00 | ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද | - 2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.08.00 | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | - 2007 අංක 48 දරණ විශ්ෂ වෙළඳ භාණ්ඩ බදු පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.99.00 | වෙනත් | - | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| **10.02** | **දේශීය භාණ්ඩ හා සේවා මත බදු** | | |
| **10.02.01.00** | **එකතු කළ අගය මත බද්ද** | - 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.02.01.01 | මුල්‍ය සේවාවන් | | |
| 10.02.01.02 | අනෙතුත් සේවාවන් | | |
| 10.02.01.03 | නිෂ්පාදන | | |
| 10.02.01.04 | ආනයන | | |
| **10.02.02.00** | **භාණ්ඩ හා සේවා බද්ද** | - 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.02.02.01 | සේවාවන් | | |
| 10.02.02.02 | නිෂ්පාදන | | |
| 10.02.02.03 | ආනයන | | |
| **10.02.03.00** | **ජාතික ආරක්ෂක බද්ද** | - 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.02.03.01 | සේවාවන් | | |
| 10.02.03.02 | නිෂ්පාදන | | |
| 10.02.03.03 | ආනයන | | |
| **10.02.04.00** | **සුරාබද්ද (ආඥා පනත)** | - 1912 අංක 8 දරන සුරාබදු අඥා පනත | සුරාබදු කොමසාරිස් ජනරාල් |
| 10.02.04.01 | මත්පැන් | | |
| **10.02.05.00** | **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු** | - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත | නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) අධ්‍යක්ෂ ජනරාල් |
| 10.02.05.01 | සිගරට් | | |
| 10.02.05.02 | මත්පැන් | | |
| 10.02.05.03 | ඛණිජ තෙල් නිෂ්පාදන | | |
| 10.02.05.04 | මෝටර් වාහන | | |
| 10.02.05.99 | වෙනත් | | |
| **10.02.06.00** | **දුම්කොළ බද්ද** | - 1999 අංක 8 දරන දුම්කොල බදු පනත | සුරාබදු කොමසාරිස් ජනරාල් |
| **10.02.07.00** | **මුද්දර ගාස්තු** | - 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.02.08.00** | **හර බද්ද** | - 2002 අංක 16 දරන හර බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.02.09.00** | **පිරිවැටුම් බද්ද** | - 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.02.10.00** | **සමාජ වගකීම් බද්ද** | - 2005 අංක 5 දරන මුදල් පනත | අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති (අදාල දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට වාර්තා කළ යුතුයි.) |
| **10.02.11.00** | **දුරකථන ග්‍රාහක බද්ද** | - 2004 අංක 11 දරන මුදල් පනත | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **10.02.12.00** | **ජාතිය ගොඩනැගීමේ බද්ද** | - 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගිමේ බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.02.12.01 | සේවාවන් | | |
| 10.02.12.02 | නිෂ්පාදන | | |
| 10.02.12.03 | ආනයන | | |
| **10.03** | **බලපත්‍ර ගාස්තු හා වෙනත්** | | |
| **10.03.01.00** | **සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද** | - 1995 අංක 16 දරන මුදල් පනත | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් |
| **10.03.02.00** | **පැවරීම් බද්ද** | - 1963 අංක 11 දරන මුදල් පනත | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| **10.03.03.00** | **ඔට්ටු හා සූදු බද්ද** | - 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.03.04.00** | **කොටස් ගනුදෙනු බද්ද** | 2005 අංක 5 දරන මුදල් පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.03.05.00** | **ඉදිකිරීමේ කර්මාන්ත ඇප සහතික වීමේ අරමුදල් බද්ද** | - 2005 අංක 5 දරන මුදල් පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.03.06.00** | **පරිසර සංරක්ෂණ බද්ද** | - 2008 අංක 26 දරන පරිසර සංරක්ෂණ බදු පනත | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **10.03.07.00** | **අනෙකුත් බලපත්‍ර ගාස්තු** | | |
| 10.03.07.01 | හෙදි නිවාස ලියාපදිංචි කිරීමේ ගාස්තු | - දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ, මුදල් රෙගුලාසි හෝ විශේෂිත රෙගුලාසිවලට අනුව | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| 10.03.07.02 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාල ලියාපදිංචි කිරීමේ ගාස්තු | - අදාල පනත්, දෙපාර්තමේන්තු චක්‍රලේඛණ හෝ විශේෂිත රෙගුලාසි වලට අනුව | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| 10.03.07.03 | පෞද්ගලික දැව ප්‍රවාහනය | - 1979 අංක 56 දරන වන ආඥා පනත | වන සංරක්ෂක |
| 10.03.07.04 | මොටර් රථ විකිණීම මත බදු | - 1951 අංක 14 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් |
| 10.03.07.05 | මහජන ආරක්ෂක අමාත්‍යාංශයට අදාල බලපත්‍ර ගාස්තු | - දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ, මුදල් රෙගුලාසි හෝ විශේෂිත රෙගුලාසිවලට අනුව | ලේකම්, රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය |
| 10.03.07.06 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට අදාල බලපත්‍ර ගාස්තු | - 1996 අංක 2 දරණ ධීවර හා ජලජ සම්පත් පනත | ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් |
| 10.03.07.99 | අනෙකුත් | - දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ, මුදල් රෙගුලාසි හෝ විශේෂිත රෙගුලාසිවලට අනුව | ලේකම්,රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු |
| **10.04** | **ආදායම හා ලාභ මත බදු** | | |
| **10.04.01.00** | **සාමූහික බදු** | - 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.04.01.01 | ආදායම් බදු | | |
| 10.04.01.02 | ලාභාංශ බද්ද | | |
| 10.04.01.03 | ප්‍රේෂණ බද්ද | | |
| **10.04.02.00** | **සාමූහික නොවන බදු** | - 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.04.02.01 | උපයනවිට ගෙවීම් බද්ද | | |
| 10.04.02.99 | අනෙකුත් | | |
| **10.04.03.00** | **රඳවා ගැනීමේ බදු** | - 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.04.03.01 | පොළිය මත | | |
| 10.04.03.99 | ගාස්තු හා වෙනත් | | |
| **10.04.04.00** | **ආර්ථික සේවා ගාස්තු** | - 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |

බදු නොවන ආදායම

| ආදායම් සංකේතාංකය | විස්තරය | ව්‍යවස්ථාව /අධිකාර බලය | ආදායම් ගණන් දීමේ නිලධාරි |
|---|---|---|---|
| **20.01** | **දෙපාර්තමේන්තුමය ව්‍යවසායයන්ගෙන් ලැබෙන ආදායම** | | |
| 20.01.01.00 | දුම්රිය | - 1902 අංක 9 දරන දුම්රිය ආඥා පනත | දුම්රිය සාමාන්‍යාධිකාරි |
| 20.01.02.00 | තැපැල් | - 1908 අංක 11 දරන ලංකා තැපැල් කාර්යාල ආඥා පනත | තැපැල්පති |
| 20.01.03.00 | අත්තිකාරම් ගිණුම (වෙළෙඳ) | - මුදල් රෙගුලාසි | අයවැය අධ්‍යක්ෂ ජනරාල් |
| **20.02** | **රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම** | | |
| **20.02.01.00** | **කුලී** | | |
| 20.02.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | - ආයතන සංග්‍රහය/ඉඩම් සංවර්ධන ආඥා පනත | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් (අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ට වාර්තා කළ යුතුයි) |
| 20.02.01.02 | රජයේ කැලෑවලින් ලැබෙන ආදායම | - 1979 අංක 56 දරන වන ආඥා පනත | වන සංරක්ෂක |
| 20.02.01.03 | ඉඩම් හා අනිකුත් බදු කුලී | - ඉඩම් සංවර්ධන ආඥා පනත සහ රාජ්‍ය ඉඩම් ආඥා පනත | ඉඩම් කොමසාරිස් |
| 20.02.01.04 | ප්‍රාදේශීය වතු සමාගම්වලින් ලැබෙන කල්බදු කුලී | - කල්බදු කුලී ගිවිසුම් | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් |
| 20.02.01.99 | අනෙකුත් කුලී | - අදාල දෙපාර්තමේන්තු චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා හෝ බදු කුලී ගිවිසුම්වලට අනුකූලව | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **20.02.02.00** | **පොළිය** | | |
| 20.02.20.01 | ණය දීම | - උප ණය ගිවිසුම් | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| 20.02.02.99 | වෙනත් | - අර්ථසාධක අරමුදල් පනත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **20.02.03.00** | **ලාභ** | - 1971 අංක 38 දරන මුදල් පනත | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් |
| **20.02.04.00** | **ලාභාංශ** | - 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ රජයට අයත් සමාගම්වල කොටස් ප්‍රාග්ධනයෙන් ලැබෙන ලාභාංශ | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් |
| **20.03** | **විකුණුම් සහ ගාස්තු** | | |
| **20.03.01.00** | **දෙපාර්තමේන්තුමය විකිණීම්** | - මුදල් රෙගුලාසි හෝ අදාල දෙපාර්තමේන්තු චක්‍රලේඛවලට අනුකූලව | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **20.03.02.00** | **පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම්** | | |
| 20.03.02.01 | විගණන ගාස්තු | - 1971 අංක 38 දරන මුදල් පනත | විගණකාධිපති |
| 20.03.02.02 | ගුවන් නාවික ගාස්තු | - ගුවන් නාවික පනත (13 (2) වගන්තිය හා 24 වගන්තිය) | වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් |
| 20.03.02.03 | 1968 අංක 32 දරණ පුද්ගලයින් ලි.ප.කිරීම් පනත යටතේ ගාස්තු | - 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් |
| 20.03.02.04 | මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අදාල ගාස්තු | - දෙපාර්තමේන්තු චක්‍රලේඛ | මැනුම්පති |
| 20.03.02.05 | රජයේ මුද්‍රණාලයේ ලැබීම් | - අදාල දෙපාර්තමේන්තු චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා හෝ බදු කුලී ගිවිසුම්වලට අනුකූලව | රජයේ මුද්‍රණාලයාධිපති |
| 20.03.02.06 | සත්ව හා වෘක්ෂලතා සංරක්ෂණ ආඥා පනත යටතේ ගාස්තු | - සත්ව සහ වෘක්ෂලතා සංරක්ෂණ ආඥා පනත | වනජීවී අධ්‍යක්ෂ ජනරාල් |
| 20.03.02.07 | වීසා බලපත්‍ර,විදේශ ගමන් බලපත්‍ර හා ද්විත්ව පුරවැසි භාවය ලබාගැනීම සම්බන්ධ ගාස්තු | - ආගමන හා විගමන පනත, පුරවැසි භාවය පනත | ආගමන හා විගමන පාලක |
| 20.03.02.08 | අපගමන බද්ද | - 2003 අංක 25 දරන මුදල් පනත | වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් |
| 20.03.02.09 | තක්සේරු දෙපාර්තමේන්තුවේ ගාස්තු | - ආයතන සංග්‍රහය | ප්‍රධාන තක්සේරුකරු |
| 20.03.02.10 | සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු | - 2007 අංක 7 දරන සමාගම් පනත | සමාගම් රෙජිස්ට්‍රාර් |
| 20.03.02.11 | සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් නෛතික ගාස්තු | - අදාල දෙපාර්තමේන්තු චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා හෝ බදු කුලී ගිවිසුම්වලට අනුකූලව | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් |
| 20.03.02.12 | රාජ්‍ය කොන්ත්‍රාත් පනත යටතේ අයකරනු ලබන ගාස්තු | - 1987 අංක 3 දරන රාජ්‍ය කොන්ත්‍රාත් පනත | සමාගම් රෙජිස්ට්‍රාර් |
| 20.03.02.13 | විභාග හා අනිකුත් ගාස්තු | - අදාල දෙපාර්තමේන්තු චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා හෝ බදු කුලී ගිවිසුම්වලට අනුකූලව | විභාග කොමසාරිස් ජනරාල් |
| 20.03.02.14 | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු හා අනිකුත් ලැබීම් | - 1951 අංක 14 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් |
| 20.03.02.16 | ගුවන් යානා කුලී ආදායම් | - අදාල දෙපාර්තමේන්තු චක්‍රලේඛ / මුදල් රෙගුලාසි | ගුවන් හමුදාපති |
| 20.03.02.17 | ඇගළුම් සඳහා දේශීය විකුණුම් මත ගාස්තු | - ආයෝජන මණ්ඩලය / රේගු රෙගුලාසි | ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්/රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 20.03.02.18 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාළ ගාස්තු | - දෙපාර්තමේන්තු චක්‍රලේඛ හා නියෝග | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් |
| 20.03.02.19 | උද්භිද උද්‍යාන ආදායම් | - 1973 අංක 32 දරණ උද්භිද උද්‍යාන පනත, දෙපාර්තමේන්තු චක්‍රලේඛ | ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් |
| 20.03.02.20 | ගිණුම් හා විගණන ප්‍රමිති සෙස් බද්ද | - 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් |
| 20.03.02.99 | විවිධ | - අදාල දෙපාර්තමේන්තු චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා හෝ බදු කුලී ගිවිසුම්වලට අනුකූලව | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් (අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ට වාර්තා කළ යුතුයි.) |
| **20.03.03.00** | **දඩ මුදල් හා රාජසන්තක කිරීම්** | - රේගු ආඥා පනතේ විශේෂිත නීතිරීති | රේගු අධ්‍යක්ෂ ජනරාල්/ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **20.03.99.00** | **අනිකුත් ලැබීම්** | - අදාල දෙපාර්තමේන්තු චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා හෝ බදු කුලී ගිවිසුම්වලට අනුකූලව | රේගු අධ්‍යක්ෂ ජනරාල්/ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **20.04** | **සමාජ සංරක්ෂණ දායක මුදල්** | - 1898 අංක 1 දරන "වැන්දඹු හා අනත් දරු" ආඥා පනත / 1953 අංක 44 දරන ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු පනත / 1970 අංක 18 දරන සන්නාහ සන්නද්ධ හමුදා වැන්දඹු හා අනත් දරු පනත/ 1983 අංක 24 දරන වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් පනත | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් |
| 20.04.01.00 | මධ්‍යම රජය | | |
| 20.04.02.00 | පළාත් සභා | | |
| **20.05** | **වර්තන පැවරීම්** | | |
| 20.05.01.00 | මහ බැංකුවේ ලාභ | - 1949 අංක 58 දරන මුදල් නීතිය පිළිබඳ පනත | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් |
| 20.05.99.00 | ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම් | - අදාල දෙපාර්තමේන්තු චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා හෝ බදු කුලී ගිවිසුම්වලට අනුකූලව | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **20.06** | **ප්‍රාග්ධන ආදායම්** | | |
| 20.06.01.00 | පැවරීමෙන් ලත් මුදල් | - 1996 අංක 1 දරන රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ පනත | ජනාධිපති ලේකම් |
| 20.06.02.00 | ප්‍රාග්ධන වත්කම් විකිණීම | - අදාල දෙපාර්තමේන්තු චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා හෝ බදු කුලී ගිවිසුම්වලට අනුකූලව | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| 20.06.03.00 | දේශීය ප්‍රාග්ධන පැවරීම | - 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 20.06.04.00 | ණය ආපසු අයකර ගැනීම | - උප ණය ගිවිසුම් | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **ප්‍රදාන** | | | |
| **30.01.01.00** | විදේශීය ප්‍රදානයන් | - විසර්ජන පනත | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |

## උපලේඛණය II - ආකෘති පත් ලැයිස්තුව

### (I) ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය වාර්තා කිරීම

#### (අ) මාසික වාර්තා - පෝර්ම අංක 1 භාවිතා කරන්න.

1. රේගු අධ්‍යක්ෂ ජනරාල්
2.දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
3. නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල්
4.සුරාබදු කොමසාරිස් ජනරාල්
5.රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් (1971 අංක 38 දරන මුදල් පනත යටතේ ගැනෙන බදු සහ රජයේ සංස්ථාවල ලාභ සහ බදු සම්බන්ධයෙන්)
6.රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් (රජයේ සංස්ථා සහ රජයේ කොටස් ඇති සමාගම් මගින් කරනු ලබන පෙ ලබන පොළි ගෙවීම් හා ණය ආපසු ගෙවීම් සම්බන්ධයෙන්
7.වැන්දඹු හා අනත්දරු ලේකම් / විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ (වැන්දඹු හා අනත්දරු එකතු කිරීම් සම්බන්ධයෙන්)

#### (ආ) ත්‍රෛමාසික වාර්තා - ෙ පෝර්ම අංක 1 භාවිතා කරන්න.

1.ආගමන හා විගමන පාලක
2.අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිසම
3.වැවිලි කර්මාන්ත විෂය භාර ලේකම් (ප්‍රාදේශීය වැවිලි සමාගම් වල බදු කුලී ගිවිසුම් සම්බන්ධයෙන්)
4.මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් (1995 අංක 16 දරන මුදල් පනත යටතේ ගැනෙන බදු සම්බන්ධයෙන්)
5.දුම්රිය  සාමාන්‍යාධිකාරි
6.තැපැල්පති

#### (ඇ) අර්ධ වාර්ෂික වාර්තා - පෝර්ම අංක 2 භාවිතා කරන්න.

### (II) හිඟ ආදායම් - පෝර්ම අංක 3 භාවිතා කරන්න.

### (III) ආදායම් ඇස්තමේන්තු

| ආයතනය | ආදායම් ඒකකය | අදාළ පෝර්ම අංකය |
|---|---|---|
| 1.රේගු දෙපාර්තමේන්තුව | ආනයන බද්ද | 4-(අ) |
| 2.දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව | එකතුකළ අගය මත බද්ද | 4-(ආ) |
| 3.රේගු දෙපාර්තමේන්තුව | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 4-(ඇ) |
| 4.දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව | සාමුහික ආදායම් බද්ද | 4-(ඈ) |
| 5.දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව | සාමුහික නොවන ආදායම් බද්ද | 4-(ඉ) |
| 6.රේගු දෙපාර්තමේන්තුව | නිෂ්පාදන (විශේෂ විධි විධාන) බද්ද | 4-(ඊ) |
| 7.සුරාබදු දෙපාර්තමේන්තුව | සුරා  බද්ද  (සුරාබදු ආඥා පනත) | 4-(උ) |
| 8.මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | මෝටර් රථවාහන බද්ද | 4-(ඌ) |
| 9. දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව | හර බද්ද | 4-(එ) |
| 10.වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | වතු සමාගම්වලින් ලැබෙන කල්බදු කුලී | 4-(ඒ) |
| 11.දුම්රිය දෙපාර්තමේන්තුව | දුම්රිය | 4-(ඔ) |
| 12.තැපැල් දෙපාර්තමේන්තුව | තැපැල් | 4-(ඕ) |
| 13.විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | සමාජ ආරක්ෂක දායකත්වය | 4-(ක) |
| 14.ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | විදේශ ගමන් බලපත්‍ර, වීසා සහ ද්විත්ව පුරවැසිභාවය | 4-(ග) |
| 15.අනෙකුත් ආයතන | | 2 |